ධම්මං පීති සුඛං සේති විප්පසන්නේන චේතසා
(දහම් රස බොන්නෝ සුවසේ තිසි වෙසෙන්නෝ)

# බෞද්ධ සංගමය

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය


අංක : 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල
දුරකථන : 011 2864134




**ප්‍රධාන අනුශාසක :**

**බත්තරමුල්ල සිරි සුදස්සනාරාමාධිපති පූජනීය ආචාර්ය**
**මිරිස්සේ ධම්මික හිමි**

## බු.ව 2553 ඉල් පොහොය


**සදහම් පත්‍රිකා අංක 10**


**උතුම් චතුරාර්‍ය්‍ය සත්‍ය අවබෝධ වීමට සඳහම් පඬුරකි**

# අවිදු අඳුර බිඳ සදහම් එළිය කරා
# අවිද්‍යා සූත්‍රය

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**"පුරිමා භික්ඛවේ කෝටි න පඤ්ඤායති අවිජ්ජාය' ඉතෝ පුබ්බේ අවිජ්ජා නාහෝසි, අථ පච්ඡා සම්භවීති, ඒවමේතං භික්ඛවේ වුච්චති, අථ ච පන පඤ්ඤායති ' ඉද පච්චයා අවිජ්ජාති"**

**"මහණෙනි, මෙයින් පෙර අවිද්‍යාව නොවිය, එයින් පසු පහළ වී යැයි" අවිද්‍යාවේ පූර්ව කෙළවරක් නොපෙනේ, එබැවින් මෙසේ පවසනු ලැබේ. නැවතත්, "ඉදප්පච්චයා" හෙවත් මෙය හේතුකොට ගෙන පෙනේ"**

කාරුණික වූ පින්වත්නි,

ඉහත සඳහන් කරනු ලැබුවේ අංගුත්තර නිකායේ, යමක වර්ගයේ සඳහන් අවිද්‍යා සූත්‍රයෙහි සඳහන් ආරම්භක ධර්ම කොටසයි. මෙම උතුම් සූත්‍ර දේශනාව තථාගත බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේදී දේශනා කළහ. චතුරාර්ය සත්‍ය ධර්මය නොදැනීම නම් වූ අවිද්‍යාව බැහැර කොට චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරන්නා වූ විද්‍යා විමුක්ති අවස්ථාවට පත්වන ආකාරය මෙමගින් අනුශාසනා කෙරේ. මෙම සූත්‍ර දේශනාවේ සඳහන් ධර්ම කරුණු පින්වත් ඔබ විසින් මතකයේ රඳවාගෙන ඇති කරුණුය. එම මතකයේ ඇති ධර්ම කොට්ඨාශය අධ්‍යාත්මික සිතින් පෙළගස්වා ගෙන ප්‍රතිපත්ති සහ ප්‍රතිවේධය සඳහා යොමුකරගන්නා ලෙසට මෙමගින් ආරාධනා කෙරේ.

මේ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුද්ධරජාණන් වහන්සේ මෙසේ දේශනා කරති. "මහණෙනි, මම අවිද්‍යාව හේතු ප්‍රත්‍ය කොට දේශනා කරමි. අහේතු ප්‍රත්‍ය කොට දේශනා නොකරමි. එනම් අවිද්‍යාව ඇතිවන්නේ හේතු සහිතව බවත් හේතුවක් නැතිව අවිද්‍යාව පහළ නොවන බවත් මෙමඟින් පැහැදිලි කෙරේ. අවිද්‍යාවේ ආහාරය කුමක් ද ? එනම් පඤ්ච නීවරණයයි. කාමච්ඡන්ද (පඤ්ච ඉන්ද්‍රියන් පිනවීම, ඇලීම, බැඳීම) ව්‍යාපාදය (තරහව) ථිනමිද්ධය (සිතේ ඇතිවන අලස බව, මලානික බව) උද්ධච්ච කුක්කුච්ච (සිතේ නොසන්සුන් කම හා හා පසුතැවීම) සහ විචිකිච්ඡා (ශාස්තෘන් වහන්සේ ඇතුළු කරුණු අටක් කෙරේ සැකය) යනුවෙනි. මෙම පඤ්ච නීවරණ ඇතිවීමට හේතුවක් ඇත. අහේතුක නොවේ. කුමක්ද ඒ හේතුව ? ත්‍රිවිධ දුශ්චරිතයයි. එනම් සිත, කය සහ වචනයෙන් සිදුවන වැරදියි. කයින් සිදුවන වැරදි තුනකි. මේවා අකුසල කර්මයෝය. ප්‍රාණ ඝාතය, සොරකම සහ කාමමිථ්‍යාචාරයයි. වචනයෙන් සිදුවන වැරදි හතරකි. බොරුකීම, කේළම් කීම, ඵරුෂ වචන කතා කිරීම සහ හිස්වචනයි. සිතින් සිදුවන වැරදි තුනකි. අභිජ්ඣා නම් වූ විෂම වූ ලෝභය, ව්‍යාපාදය සහ මිථ්‍යා දෘෂ්ටියයි. මෙම ත්‍රිවිධ දුශ්චරිත ඇතිවීමට ද හේතුවක් ඇත. අහේතුකව සිදු නොවේ. කුමක්ද හේතුව හෙවත් ආහාරය.. ? ඉන්ද්‍රිය අසංවරයයි. මෙහිදී ඇස ආදී පංච ඉන්ද්‍රියන්ගේ මෙන්ම මනසද ඇතුලත්ව ඉන්ද්‍රිය සයෙහි ඇතිවන්නා වූ අසංවර බවයි. ඉන්ද්‍රියන්හි අසංවරවීමට ද හේතුවක් ඇත. හේතුවක් නැතිව සිදු නොවේ. කුමක්ද එම හේතුව ? අස්මෘති අසම්ප්‍රජනයයි. එනම් සිහිය නොපිහිටුවීම සහ සිහිනුවණින් යුතුව කටයුතු නොකිරීමයි. මෙය ඇතිවීමට හේතුවන ආහාරය කුමක් ද ? එනම් අයෝනිසෝමනසිකාරයයි. මෙහි අදහස නම් මේ මොහොතෙහි කරන ක්‍රියාවට සිත මනාව අරමුණු කර තබාගැනීමයි. තවදුරටත් පැහැදිලි කරන්නේ නම් රාග, දෝස, මෝහ ආදී කෙලෙස්වලට සිත හසුනොවීමට තරම් සිහිනුවණ පවත්වා ගැනීමයි. අයෝනිසෝමනසිකාරයට හේතුවක් තිබේ. අහේතුකව පහළවීමට නොහැකිය. කුමක් ද එම ආහාරය හෙවත් හේතුව ? ශ්‍රද්ධාව නොමැතිකම හෙවත් නුවණින් යුතුව නොඇදහීමයි. මෙය කෙටියෙන් විස්තර කළ හැකිය. "සද්ධෝහෝති සද්ධහති තථාගස්ස බෝධිං" යනුවෙන් ශ්‍රද්ධාව යනු තථාගතයන් වහන්සේ වදාළ චතුරාර්ය සත්‍ය ධර්මය කෙරේ අවබෝධයෙන් යුතුව ලද ඇදහීමයි. අයෝනිසෝමනසිකාරයට හේතු වූයේ එසේ ශ්‍රද්ධාවෙන් බැහැරවීම හෙවත් නොඇදහීමයි. එසේ නොඇදහිලි ස්වභාවයටද හේතුවක් ඇත. අහේතුකව සිදු නොවේ. එම හේතුව හෙවත් ආහාරය කුමක් ද ? එනම් අසද්ධර්ම ශ්‍රවණයයි. වැරදි වූ මිථ්‍යා දෘෂ්ඨි අදහස් ඇසීමයි. මෙම අසද්ධර්ම ශ්‍රවණයට ද හේතුවක් හෙවත් ප්‍රත්‍යයක් ඇත. ප්‍රත්‍යයක් නොමැතිව සිදුනොවේ. කුමක්ද ඒ ප්‍රත්‍යය හෙවත් ආහාරය. ? "අසප්පුරිය සංසේවෝ" නම් අසත්පුරුෂ ආශ්‍රයයි.

- තථාගත බුදුරජාණන් වහන්සේ නැවතත් කෙළවර ලැබූ අනිටු ආදීනවයේ සිට අවිද්‍යාවට හේතු පැහැදිලි කොට දේශනා කරන සේක

"මහණෙනි, මෙසේ අසත්පුරුෂ ආශ්‍රය සම්පූර්ණ වන්නේ අසද්ධර්මය ශ්‍රවණ ය සම්පූර්ණ කරයි. අසද්ධර්ම ශ්‍රවණය සම්පූර්ණ වන්නේ නොඇදැහිලි බව සම්පූර්ණ කරයි.

අයෝනිසෝමනසිකාරය සම්පූර්ණ වන්නේ අස්මෘති අසම්පජනයය සම්පූර්ණ කරයි. අස්මෘති අසම්පජනයය සම්පූර්ණ වන්නේ ඉන්ද්‍රිය අසංවරය සම්පූර්ණ කරයි. ඉන්ද්‍රිය අසංවරය සම්පූර්ණ වන්නේ ත්‍රිවිධ දුශ්චරිතයන් සම්පූර්ණ කරයි. ත්‍රිවිධ දුශ්චරිතයන් සම්පූර්ණ වන්නේ පඤ්චනීවරණයන් සම්පූර්ණ කරයි. පඤ්චනීවරණයන් සම්පූර්ණවන්නේ අවිද්‍යාව සම්පූර්ණ කරත්. මෙම හේතු කාරණාවෝම අවිද්‍යාවට හේතූන් හෙවත් ප්‍රත්‍යයෝ වෙති. මෙසේම පරිපූර්ණ භාවය ද සිදුවෙයි"

තථාගත බුදුරජාණන් වහන්සේ මනහර වූ උපමාවක් දක්වති. "මහණෙනි, යම්සේ පර්වතයක් මතුයෙහි මහා වැසි වැටෙන කල්හි, ඒ වැසි ගලාගොස් නිම්නවලට වැටී සම්පූර්ණ වෙයි. ඒ තැන් වලින් ගලාගොස් කඳු සිඛර සම්පූර්ණ කරමින්  ගොස් පර්වත වල පැලුනු තැන්වල ඇති ශාඛාවෝ සම්පූර්ණ කෙරේ. එසේ සම්පූර්ණ වෙමින් ගොස් කුඩා වළවල් සම්පූර්ණ කරති. කුඩා වළවල් සම්පූර්ණ කරමින් ගොස් මහා වළවල් සම්පූර්ණ කරති. මහා වළවල් සම්පූර්ණ කොට කුඩා නදීන් පුරවති. කුඩා නදීන් පුරවා මහා නදීන් පුරවති. මහා නදීහු සම්පූර්ණ වූයේ මහා සමුද්‍රය පිරෙත්. මෙය මහා සමුද්‍රය පරිපූර්ණ වීමට හේතු කාරණා හෙවත් ප්‍රත්‍යයෝය. මෙයම පරිපූර්ණ භාවයයි" මෙම ඉතා සරල උපමාවෙන් ඉහත පැහැදිළි කළ අවිද්‍යාවේ හේතූන් ද ක්‍රම ක්‍රමයෙන් සැකැසුණු ආකාරය ඔබට ද අවබෝධ කරගැනීමට පහසු වනු ඇත.

තථාගත බුදුරජාණන් වහන්සේ මින් අනතුරුව කුසල් මාර්ග වූ විද්‍යා විමුක්තිය දේශනා කරති. "මහණෙනි, මම විද්‍යා විමුක්තිය හේතු ප්‍රත්‍ය කොට දේශනා කරමි. හේතු රහිත බව දේශනා නොකරමි. විද්‍යා විමුක්තියට හේතු කවරේ ද ? සත්ත බෝධි අංග බව කිවයුතු වෙයි. එනම්, සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි හා උපෙක්ඛායි. සත්ත බෝධි අංගද හේතු ප්‍රත්‍ය කොට දේශනා කරමි. හේතුවක් නැතැයි දේශනා නොකරමි. සත්ත බෝධි අංග ධර්මයන්ගේ හේතුව කුමක් ද ? එනම් සතර සතිපට්ඨානය බව පැවසිය යුතුවෙයි. සතර සතිපට්ඨානයට හේතු ප්‍රත්‍ය ඇති බව දේශනා කරමි. එසේ නොවේ යයි දේශනා නොකරමි. කුමක්ද ඒ හේතුව ? ත්‍රිවිධ සුචරිතයයි. ත්‍රිවිධ සුචරිතය ද හේතු ඇතිවම පහ වන බව දේශනා කරමි. එසේ නොවේ යයි දේශනානොකරමි. කුමක් ද එම හේතුව ? ඉන්ද්‍රිය සංවරයයි. ඉන්ද්‍රිය සංවරය ද හේතු සහිතවම ඇතිවෙයි. එය එසේ නොවේ යයි දේශනා නොකරමි. කුමක් ද ඒ හේතුව ? ස්මෘති සම්ප්‍රජනයයයි. ස්මෘති සම්ප්‍රජනයය ද ප්‍රත්‍ය සහිතය. එසේ නොවේ යයි දේශනා නොකරමි. කුමක්ද ඒ හේතු ප්‍රත්‍ය? යෝනිසෝමනසිකාරය බව කිය යුතුවෙයි. යෝනිසෝමනසිකාරය ද හටගන්නේ හේතු සහිතවම බව දේශනා කරමි. එසේ නොවන  බව දේශනා නොකරමි. කුමක් ද ඒ හේතු ප්‍රත්‍ය ? ශ්‍රද්ධා යයි කිය යුතු වෙයි. මහණෙනි, මම ශ්‍රද්ධාවද හේතු සහිත යයි දේශනා කරමි. එසේ නොවේ යයි දේශනා නොකරමි. කුමක් ද ඒ හේතුව ? සද්ධර්ම ශ්‍රවණය යයි කිය යුතු වෙයි. සද්ධර්ම ශ්‍රවණය ද ප්‍රත්‍ය සහිත බව දේශනා කරමි. එසේ නොවේ යයි දේශනා නොකරමි. සද්ධර්ම ශ්‍රවණයට හේතුව කුමක් ද ? සත්පුරුෂ සංසේවනය යයි කිය යුතු වෙයි.

තථාගත බුදුරජාණන් වහන්සේ නැවතත් අප කෙරේ මහත් වූ කරුණාවෙන් පැහැදිලි කොට දේශනා කරති. "මහණෙනි, මෙසේ සත්පුරුෂ සංසේවනය සම්පූර්ණ වූයේ සද්ධර්ම ශ්‍රවණය සම්පූර්ණ කරයි. සද්ධර්ම ශ්‍රවණය සම්පූර්ණ වූයේ ශ්‍රද්ධාව පූර්ණය කරයි. ශ්‍රද්ධාව සම්පූර්ණ වූයේ යෝනිසෝමනසිකාර සම්පූර්ණ කරයි. යෝනිසෝමනසිකාරය සම්පූර්ණ වූයේ සති සම්පජඤ්ඤය සම්පූර්ණ කරයි. සතිසම්පජඤ්ඤය සම්පූර්ණ වූයේ ඉන්ද්‍රිය සංවරය පූර්ණය කරයි. ඉන්ද්‍රිය සංවරය සම්පූර්ණ වූයේ ත්‍රිවිධ සුචරිතයන් පූර්ණ කරයි. ත්‍රිවිධ සුචරිතයන් සම්පූර්ණ වූයේ සතර සතිපට්ඨාන සම්පූර්ණ කෙරෙති. සතර සතිපට්ඨාන සම්පූර්ණ කෙරෙනුයේ සත්ත බෝධිඅංග පූර්ණය කෙරේ. සත්ත බෝධි අංග සම්පූර්ණ වූවාහු විද්‍යා විමුක්තිය පුරත්, එය විද්‍යා විමුත්තියේ හේතුව හෙවත් ප්‍රත්‍ය වෙයි. එයම පරිපූර්ණ භාවයයි.

මෙම විද්‍යා විමුක්තිය ලෙස පැහැදිලි කරන්නේ චතුරාර්ය සත්‍ය අවබෝධයයි. අවිද්‍යාව යනු චතුරාර්ය සත්‍ය ධර්මයෙහි ඇති අනවබෝධයයි. චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ නොවීමට හේතූන්ද උතුම් වූ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධයට හේතුවන ප්‍රත්‍යයන්ද තථාගත බුදුරජාණන් වහනසේ දේශනා කරති. උපමා උපමායෙන්ද පැහැදිලි කළේ සියළු සත්වයන් කෙරේ කාරුණික වූ හදවතින්මය. එය මහා කරුණාවයි. ඔබට මෙහි විශේෂිත කරුණකට අවධානය යොමු කරමි. එනම් සත්පුරුෂ ආශ්‍රයක් නැතිවීම හෝ අසත්පුරුෂ ආශ්‍රය අවිද්‍යාවේ මූලයට හේතුවන බවයි. සත්පුරුෂ ආශ්‍රයම විද්‍යා විමුත්ති නම් වූ චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධයට මූලික වන බවයි. අපට එම කල්‍යාණ මිත්‍ර හෙවත් සත්පුරුෂ ආශ්‍රය ලැබී තිබේ. ඒ භාග්‍යවතුන් වහන්සේ හමුවීමයි. එනම් චතුරාර්ය සත්‍ය ධර්මය අසන්නට දකින්නට, සමාධිය වඩන්නට අවස්ථාව සැලසීමයි. අපි සතර සම්‍යක් ප්‍රධාන වීර්ය වඩමු. තථාගත බුදුරජාණන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධයෙන්ම දැකගන්නට වීර්ය දරමු. උතුම් චතුරාර්ය සත්‍ය ධර්ම අවබෝධයෙන් නිර්වාණාවබෝධයම වේවා.

## ඔබ සැමට උතුම් චතුරාර්ය සත්‍ය ධර්මයම අවබෝධ වේවා
## උතුම් නිර්වාණාවබෝධයම වේවා !

**බත්තරමුල්ල පන්නිපිටිය පාරේ සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක**
**ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි.**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවයේ යෙදී සිට මියගිය සියළු දෙනාම**
**සුගතියෙන් සුගතියට පත්වීමට මේ පිනු හේතුවේවා ! එතෙර රැකියාවෙහි නිරතවන**
**සියළුම සංක්‍රමණික සේවකයින්ට ද දැනට සේවයේ යෙදී සිටින සභාපතිතුමා ඇතුළු**
**සියළු කාර්ය මණ්ඩලයටද නිරෝගී සුව දීර්ඝායුෂ පැතීම සඳහා බෞද්ධ සංගමය පිරිනමන දහම් පඬුරකි**

**ඔබේ මියගිය ඥාතීන් සිහිපත් කර මෙම සදහම් පත්‍රිකාව මුද්‍රණය කිරීමට ඔබට දායක විය හැක.**
**දුරකථන : 011 2864134**